රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2025

මගේ අංකය : EST-7/05/ALW/1009
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2025.03.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ඒ ආකාරයේ අනෙකුත් ක්‍රියාකාරකම් මෙහෙයවන සම්පත්දායකයින්ට දීමනා ගෙවීම</u>**

රජයේ නිලධරයන් සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන්වලදී සම්පත්දායකත්වය ලබාදෙන සම්පත්දායකයින් සඳහා දීමනා ගෙවීම පොදු ක්‍රමවේදයකට අනුව සිදු කිරීම අරමුණු කර ගනිමින් 2025.03.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කෙරේ.

02. විධිමත් අධිකාරී බලයක් සහිතව රජයේ ආයතනවල පවත්වනු ලබන ඉහත වැඩසටහන් සඳහා සම්පත්දායකයින් වශයෙන් ක්‍රියාකරනු ලබන රාජ්‍ය ආයතනවල නිලධරයන්ට පහත සඳහන් පරිදි දීමනා ගෙවිය යුතු ය.

| | තනතුර | අනුමත දීමනාව (පැයකට රු.) |
|---|---|---|
| 01. | අමාත්‍යාංශ ලේකම්වරුන්/ පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්/ මහාචාර්යවරුන් | 2400/- |
| | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධරයන්/ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | |
| 02. | පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් | 2000/- |
| | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල I වන ශ්‍රේණියේ නිලධරයන්/ ඒකාබද්ධ සේවාවල විධායක සේවා ගණයේ I වන ශ්‍රේණියේ නිලධරයන්/ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ I වන ශ්‍රේණියේ නිලධරයන් | |
| | ජාතික අධ්‍යාපන ආයතනය හා ඊට සමාන්තර අධ්‍යාපන ආයතනවල අධ්‍යක්ෂ හෝ ඊට ඉහළ තනතුරු දරන්නන් | |
| | ගුරු අධ්‍යාපනඥ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් | |
| 03. | පිළිගත් විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරුන් | 1800/- |
| | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල II ශ්‍රේණියේ නිලධරයන්/ ඒකාබද්ධ සේවාවල විධායක සේවා ගණයේ II වන ශ්‍රේණියේ නිලධරයන්/ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ II වන ශ්‍රේණියේ නිලධරයන් | |
| | ජාතික අධ්‍යාපන ආයතනය හා ඊට සමාන්තර අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් | |
| | ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් | |

| | තනතුර | අනුමත දීමනාව (පැයකට රු.) |
|---|---|---|
| 04. | පිළිගත් විශ්වවිද්‍යාලයක ආධුනික කථිකාචාර්යවරුන් | 1600/- |
| | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල III වන ශ්‍රේණියේ නිලධරයන්/ ඒකාබද්ධ සේවාවල විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නිලධරයන්/ දෙපාර්තමේන්තුගත විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නිලධරයන් | |
| | ජාතික අධ්‍යාපන ආයතනය හා ඊට සමාන්තර අධ්‍යාපන ආයතනවල කථිකාචාර්යවරුන් | |
| | ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධරයන් | |
| 05. | ඉහත තනතුරු නොදරන උපාධිධාරීන් | 1400/- |
| 06. | අනෙකුත් සුදුසුකම් සහිත දේශකයන් | 1200/- |

03. ඉහත වගුවේ **"පිළිගත් විශ්වවිද්‍යාලයක"** යනු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් වේ.

04. ඉහත පරිදි දීමනා ගෙවීමේ දී පහත කොන්දේසි අදාළ වේ.

<u>**කොන්දේසි**</u>

I. පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන්වලදී සම්පත්දායකත්වය ලබාදෙන සම්පත්දායකයින් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ වන අතර, ඉගැන්වීම් සහ පුහුණු කිරීම් සිදු කිරීම සිය ප්‍රධාන රාජකාරිය වන ආයතනයකින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගත යුතු ය.

II. එක් සම්පත්දායකයෙකු සඳහා දිනකට උපරිම පැය 03ක කාලයක් සඳහා පමණක් දීමනා ගෙවිය යුතුය. පහත III හි සඳහන් අවස්ථාවන්හි දී හැර, පැය 03ක උපරිම කාලය ඉක්මවා අදාළ දේශනය පැවැත්වූවත්, දීමනා ගෙවිය යුත්තේ උපරිම පැය 03ක කාලය සඳහා පමණි.

III. දේශනයට ඇතුළත් කණ්ඩායම් වැඩ සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් හේතුවෙන් අදාළ දේශනය ඉහත කාල සීමාව ඇතුළත සම්පූර්ණ කිරීම ප්‍රායෝගික නොවීම යන කරුණ මත පමණක්, පැය 03ක උපරිම කාල සීමාව ඉක්මවා උපරිම පැය 06ක් දක්වා දීමනා ගෙවිය හැකි ය.

IV. ඉහත පරිදි දේශන කාලය පැය 03 ඉක්මවන්නේ නම්, එම කාල සීමාව ඉක්මවා දීමනා ගෙවීමට ඉහත III හි සඳහන් කොන්දේසිය සපුරා ඇති බවට ආයතන ප්‍රධානියා පෞද්ගලිකව සෑහීමට පත් විය යුතු අතර, අදාළ කාල සීමාව තුළ දේශනයේ කටයුතු අවසන් කර තිබිය යුතු ය.

V. පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන්වලදී, එක් දේශනයක් සඳහා සම්පත්දායකයින් කිහිපදෙනෙකු විසින් සම්පත්දායකත්වය ලබාදීම සිදුකරනු ලබන අවස්ථාවකදී, උපරිම දේශන කාලයට අදාළ ඉහත II, III හා IV හි සඳහන් කොන්දේසි වලට යටත්ව, ඉහත වගුව මඟින් පැයකට අනුමත දීමනාව, අදාළ සම්පත්දායකයින් අතර බෙදී යන පරිදි ගණනය කර, එක් එක් සම්පත්දායකයා සඳහා පැයකට ගෙවිය යුතු දීමනාව තීරණය කළ යුතු ය.

VI. අභ්‍යන්තර නිලධාරීන් සම්පත්දායකයින් ලෙස යොදවා ගැනීමේ දී එම කාර්යය ඔවුන්ගේ නිත්‍ය රාජකාරියට පරිබාහිර කාර්යයක් නම් පමණක් මෙන්ම තම නිත්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව එම කාර්යයෙහි යෙදී ඇත්නම් පමණක් ඉහත සඳහන් පරිදි දීමනා ගෙවිය යුතු ය.

VII. කිසියම් ආයතනයක් සාමාන්‍ය රාජකාරී වේලාව තුළ තම ආයතනයේ නිලධරයන් සඳහා කිසියම් පුහුණු වැඩසටහනක් පවත්වනු ලබන්නේ නම්, ඒ සඳහා සම්පත්දායකත්වය ලබාදෙන

එම ආයතනයේ නිලධරයන්ට (අභ්‍යන්තර සම්පත්දායකයන්ට) සම්පත්දායක දීමනා නොගෙවිය යුතු අතර, සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බැහැරව හෝ අදාළ ආයතනයේ නොවන නිලධරයන් සඳහා හෝ පුහුණු වැඩසටහන් පවත්වනු ලබන්නේ නම්, එවිට එම ආයතනයේ නිලධරයන්ට ද සම්පත්දායක දීමනා ගෙවිය හැකිය.

VIII. එසේම, සම්පත්දායකත්වය සඳහා නිලධරයන් යොදවා ගැනීමේදී අදාළ ආයතන ප්‍රධානියාගේ අවසරය මත, සම්පත්දායකත්වය ලබාදෙන නිලධරයන්ගේ සාමාන්‍ය රාජකාරීවලට බාධාවක් නොවන සේ යොදවා ගැනීමට කටයුතු කළ යුතු ය.

IX. විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සම්පත්දායකයින් ලෙස යොදවා ගැනීමේ දී, ඔවුන් විශ්‍රාම යන අවස්ථාවේ දරන ලද තනතුර මත පදනම්ව ඉහත වගුවේ සඳහන් පරිදි ගෙවීම් සිදු කළ යුතු අතර, උපරිම දේශන කාලයට අදාළ ඉහත II, III සහ IV කොන්දේසි නොවෙනස්ව පැවතිය යුතු ය.

X. ඉහත කාර්යයන් සඳහා වෙනත් කිසිදු දීමනාවක් නොගෙවිය යුතු ය.

05. නේවාසිකව පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන් පැවැත්වීමේ දී ඒ සඳහා සහභාගීවන්නන්හට නවාතැන් පහසුකම් සහ ආහාර පාන සැපයීම සිදුකරන්නේ නම්, එම නිලධරයන් සඳහා සංයුක්ත දීමනා නොගෙවිය යුතු අතර, ප්‍රවාහන පහසුකම් ලබා නොදෙන්නේ නම් පමණක් පවත්නා විධිවිධාන අනුව ගමන් වියදම් ලබා ගත හැකිය.

06. පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන් පැවැත්වීමට සහ ඒ සඳහා යෝග්‍ය දේශකයන් යොදවා ගැනීමට අවශ්‍ය වන අනුමතිය, අමාත්‍යාංශ ලේකම්වරයා වෙතින් හෝ අදාළ නිසි බලධරයා වෙතින් ලබා ගැනීම මෙන්ම, රජයට අවාසිදායක නොවන ආකාරයට ඉහත කටයුතු පවත්වාගෙන යාම ආයතන ප්‍රධානියාගේ වගකීමකි.

07. සම්පත්දායක දීමනා ගෙවීම් කිරීම සඳහා දැනට ලබා දී ඇති අනුමතීන් 2025.02.28 දින දක්වා පමණක් වලංගු වන අතර, 2025.03.01 දින සිට මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය.

08. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය


දුරකථන : 011-2697233
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vii@pubad.gov.lk